## 2.31 ජාතික උරුමය, රූපවාහිනී මාධ්‍යය භාවිතය සහ දේශපාලනය

සමන් රාජපක්ෂ[1], හරේන්ද්‍රලාල් නාමල්ගමුව[2], ගාමිණී අදිකාරි[3], ප්‍රිශාන්ත ගුණවර්ධන[2]
[1]පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය. [2]පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය. [3]පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනය, කැලණිය විශ්වවිද්‍යාලය.

## ABSTRACT

වර්තමානයේ දී ජාතික චින්තනය, දේශීය සංස්කෘතිය, ජාතික අනන්‍යතාවය, පොදුවේ ගත්කළ ජාතික උරුමය යනාදී සංකල්පයන් පිළිබඳව අතිමහත් ප්‍රබෝධයක් ශ්‍රී ලාංකීය සමාජය තුළ ඉස්මතු වෙමින් පවතී. මෑත කාලීනව ශ්‍රී ලංකාවේ සිදුවූ දේශපාලනික පරිවර්තනයන් යට දැක්වූ ජාතික ප්‍රබෝධය කෙරෙහි සෘජු ලෙසම ඉවහල් වී ඇති බව පෙනෙන්නට තිබේ. මෙහිදී ප්‍රබල විද්‍යුත් මාධ්‍යයක් වන රූපවාහිනිය සුවිසල් කාර්ය භාරයක් ඉටුකරමින් සිටී. ඒ රූපවාහිනිය සතු මානව ජීවිතය ඉතා සියුම් ලෙස වෙනස් කරවීමේ හැකියාව (O'Donnell, 2007) උපයෝගී කොට ගනිමිනි.

නමුත් පොදුවේ ගත්කළ ජාතික උරුමයන් පිළිබඳව රූපවාහිනී මාධ්‍යය ඔස්සේ ගොඩනැගෙන්නා වූ කතිකාවන් යථාර්ථවාදයෙන් බැහැරව පවතී. එකී සෑම රූපවාහිනී වැඩසටහනක් ම පාහේ කේන්ද්‍රගතව ඇත්තේ ජාතික අභිලාෂයන් මුදුන්පත් කරනවා වෙනුවට දේශපාලනික හා ආර්ථික අවශ්‍යතාවයන් ඉටුකරලීම වෙනුවෙනි. ජාතික උරුමයන් පිළිබඳව ලාංකීය සමාජය ගැඹුරු සංවාදයක් කරා මෙහෙයවීම අද්‍යයතන රූපවාහිනී වැඩසටහන් ඔස්සේ සිදුවන්නේ අල්ප වශයෙනි. බොහෝ වැඩසටහන් ජාතික උරුමයන් යන්න මතුපිටින් ස්පර්ශ කිරීමට පමණක් සීමාවී ඇත. තවත් වැඩසටහන් ක්‍රියාත්මක වන්නේ දේශපාලනික න්‍යාය පත්‍රයකට අනුව ය. මෙලෙස රූපවාහිනිය ඔස්සේ ගොඩනංවනු ලබන නව සමාජ සංස්කෘතිය විසින් මිනිස් ජීවිත අර්ථ ශූන්‍ය තත්ත්වයක් කරා මෙහෙයවන අතර පහත් පෙළේ ආධ්‍යාත්මික චමත්කාරයක් වෙත පුද්ගල මනස මෙහෙයවනු ලබයි.

අද්‍යතනයේ ජාතික උරුමය යන්න සිංහල ජන සමාජයට සහ සිංහල බෞද්ධ සංස්කෘතියට පමණක් සීමා වී ඇත. ශ්‍රී ලංකාව තුළ අන් ජාතියකට අයත් සංස්කෘතියක තීරුවක් පිළිබඳව, විශේෂයෙන් රූපවාහිනී මාධ්‍යය ඔස්සේ අවධානය යොමු කර ඇත්තේ මඳ වශයෙනි.

**ආශ්‍රිත ග්‍රන්ථ:**

O'Donnell, Victoria (2007) Television Criticism, Sage Publication, USA.